ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්ः 2346257, 2477739
ඊ-මේල්ः dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියः www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2014/01/01 |

## උද්ධමනය 2013 දෙසැම්බර් මාසයේ දී මැදි තනි ඉලක්කමක මට්ටමෙහි ස්ථාවර වෙයි.

නොකඩවා වසර පහකට ආසන්න කාලයක් තුළ, තනි ඉලක්කමක මට්ටමෙහි පැවති උද්ධමනය, 2013 දෙසැම්බර් මස වනවිට හිතකර මැදි තනි ඉලක්කමක මට්ටම දක්වා සැලකිය යුතු ලෙස පහත වැටිණි. විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් පසු, උද්ධමනය තනි ඉලක්කමක මට්ටමෙහි පැවති දීර්ඝතම කාලපරිච්ඡේදය මෙයයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ව්‍යාපාරික හා ආයෝජක විශ්වාසනීයත්වය වර්ධනය කරමින් 2012 දෙසැම්බර් මාසයේ වාර්තා කළ සියයට 9.2 ට සාපේක්ෂව 2013 දෙසැම්බර් මාසයේ දී ලක්ෂ්‍යාමය පදනම මත සියයට 4.7 දක්වා පහත වැටිණි. මෙය 2012 මාර්තු මාසයේ සිට වාර්තා වූ අවම මට්ටම වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද අනුයාත හත්වැනි මාසයටත් තවදුරටත් පහත වැටෙමින් 2013 දෙසැම්බර් මාසයේ දී සියයට 6.9 දක්වා ළඟා විය.







2013 වසරේ දී වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 6.9 ක් දක්වා පහත වැටීමට ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් ඉහළ යාමේ වේගය අඩු වීමයි. එනම්, 2012 වසරේ දී සියයට 10.0 ක් වූ මෙම කාණ්ඩයේ මිල ඉහළ යාම 2013 වසරේ දී සියයට 6.1 ක් විය. පෙට්‍රල්, ඩීසල්, භූමි තෙල් මිල ගණන් සහ බස් ගාස්තු ඉහළ නැංවීම මගින් උද්ධමනය මත 2013 වසරේ දී ඇති වූ බලපෑම පෙර වසරට වඩා අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රවාහන උප කාණ්ඩයේ සාමාන්‍ය මිල ගණන් සියයට 4.6 කින් පමණක් ඉහළ නැගිණි. මීට අමරතව, සෞඛ්‍ය (සියයට 1.7 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තුව (සියයට 4.0 කින්); රෙදිපිළි හා පාවහන් (සියයට 5.4 කින්) යන උප කාණ්ඩයන්හි සාමාන්‍ය මිල ගණන් 2012 වසරට වඩා 2013 වසරේ දී සාපේක්ෂව අඩු වශයෙන් ඉහළ යාම, මෙම උද්ධමනය පහළ යාම කෙරෙහි හිතකර දායකත්වයක් සැපයීය. කෙසේ වුවද, 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ වූ සියයට 7.9 ක වැඩි වීම උද්ධමනය ඉහළ යාම කෙරෙහි පීඩනයක් ඇති කළේය.

උද්ධමනයේ දිගු කාලීන යටිදැරි උපනතීන් ග්‍රහණය කරනු ලබන මූලික උද්ධමනය ද 2013 වසරේ දී පහළ යාමේ මාවතක ගමන් කරමින් 2007 වසරේ එය හඳුන්වා දීමෙන් පසුව වාර්තා කළ අවම අගය කරා ළඟා විය. 2012 දෙසැම්බර් මාසයේ දී සියයට 7.6 ක් වූ ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය නොකඩවා අඩු වෙමින්, 2013 දෙසැම්බර් මාසයේ දී එහි අවම අගය වූ සියයට 2.1 කරා ළඟා විය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද, 2013 මැද භාගයේ සිට අඛණ්ඩව පහළ යමින් 2013 දෙසැම්බර් මාසය වනවිට සියයට 4.4 දක්වා ළඟා විය. මෙම හිතකර වර්ධනයන් මගින්, ඉල්ලුම දෙසින් හට ගන්නා මිල පීඩනයන් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද විචක්ෂණශීලී ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තීන්වල සාධනීය බව පිළිබිඹු කෙරේ.